**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත**

**மாகாண அரசாங்க சேவை ஆணைக்குழு தென் மாகாணம்**

PROVINCIAL PUBLIC SERVICE COMMISSION, SOUTHERN PROVINCE

දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය සංකීර්ණය,6 වන මහල,කළුවැල්ල, ගාල්ල. / மாவட்ட செயலாளர் ஒன்றியம்,6ம் மாடி, கலுவெல்ல, காலி. / District Secretariat,6th Floor, Kaluwella, Galle.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | SP/PSC/07/Trans/2026 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2026.01.19 |

දකුණු පළාත් සභාවේ,<br>
ප්‍රධාන ලේකම්,<br>
ආණ්ඩුකාර ලේකම්,<br>
සභා ලේකම්,<br>
අමාත්‍යාංශ ලේකම් (ප්‍රධාන /ධීවර/ කෘෂිකර්ම/ක්‍රීඩා/අධ්‍යාපන)<br>
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු/ සැලසුම්)

**<u>දකුණු පළාත් කළමනාකරණ සේවා නිලධාරී අධි ශ්‍රේණියට අයත් නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2026</u>**

දකුණු පළාත් කළමනාකරණ සේවා නිලධාරී අධි ශ්‍රේණිය නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් -2026 සඳහා කෙටුම්පත් කරන ලද දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2026 හා ස්ථාන මාරු පරිපාටිය සඳහා 2026.01.13 දිනැතිව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලැබී ඇති බව දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/1/1/5/ස්ථානමාරු/04 හා 2026.01.13 දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇත.

02. ඒ අනුව, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2026 හා ස්ථාන මාරු පරිපාටිය මේ සමඟ අමුණා එවන අතර මේ බව ඔබ යටතේ පවතින සියලු ආයතන දැනුම්වත් කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි. තවද මෙම චක්‍රලේඛය හා පරිපාටිය අපගේ නිල වෙබ් අඩවියේද (http://psc.sp.gov.lk) ප්‍රසිද්ධ කර ඇත.

03. තවද, සුදුසුකම් ලබන නිලධාරීන් සඳහා වූ අයදුම්පත් 2026.02.23 දිනට පෙර හා ආකෘති අංක 02 අනුව සැපයිය යුතු තොරතුරු 2026.02.05 දිනට පෙර මා වෙත ලැබීමට ඔබ යටතේ පවතින සියලු ආයතන දැනුම්වත් කරන මෙන්ද වැඩිදුරටත් දන්වා සිටිමි.

සී.පී. රාජකරුණා<br>
ලේකම්<br>
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br>
දකුණු පළාත

සී.පී. රාජකරුණා<br>
ලේකම්<br>
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව


දුරකථන / தொலைபேசி / Telephone
- සභාපති/தலைவர்/ Chairman : 091-2222497
- ලේකම්/செயலாளர்/ Secretary : 091-2233366
- සහකාර ලේකම්/உதவி செயலாளர்/Asst.Secretary: 091-2248450
- කාර්යාලය/அலுவலகம்/Office : 091-2234309

ෆැක්ස් / பெக்ஸ் / Fax : 091 - 2228811

ඊ-මේල් / ஈ-மெயில் / e-mail : secretary@psc.spgov.lk

**දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 01/2026**

මගේ අංකය : එස්පී/පීඑස්සී/පරිනි
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
06 වන මහල,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
ගාල්ල.
2026.01. 19

දකුණු පළාත්
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සභා ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

**දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුතු කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් - 2026**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද කාර්ය පටිපාටික රීති - කාණ්ඩ අංක 1 හි XVIII පරිච්ඡේදයේ සඳහන් රාජ්‍ය සේවයේ නිලධරයන්ගේ ස්ථාන මාරු කිරීම් සම්බන්ධයෙන් වූ විධිවිධානවලට ඔබගේ අවධානය යොමු කරමි.

02. දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුතු කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් 2026 ජූලි 20 දින සිට බල පැවැත්වෙන සේ ක්‍රියාත්මක කළ යුතු අතර එහිදි නිලධරයන්ට මෙන්ම රාජ්‍ය සේවයට ද ඇතිවන අපහසුතා මගහැරවීම පිණිස පහත සඳහන් ආකාරයට ස්ථාන මාරුවීම් පිළිබඳව ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට සැලකිළිමත් විය යුතු ය.

03. ස්ථාන මාරු මණ්ඩලය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේදී පැවැත්වෙන අතර එහි දී ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, ප්‍රධාන ලේකම් කාර්යාලය, සභා ලේකම් කාර්යාලය, සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන අතර ස්ථාන මාරුවීම් පිළිබඳව තීරණය ගනු ඇත.

04. ස්ථාන මාරුවීම් සඳහා නිලධරයන්ගේ සුදුසුකම් ආදිය ගැන තීරණය කිරීමේ දී මේ සමඟ අමුණා ඇති මාරුවීම් පටිපාටිය උපයෝගී කරගනු ලැබේ.

05. කිසියම් සේවා ස්ථානයක අවුරුදු 03 ක සේවා කාලයක් ඇති නිලධරයන් ස්ථාන මාරු ඉල්ලුම් කළ හැකි අතර අවුරුදු 05 සම්පූර්ණ කළ නිලධාරීන් ස්ථාන මාරු ඉල්ලුම් කිරීම අනිවාර්ය වේ.

06. ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක අවුරුදු 03ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීහු අනිවාර්යයෙන් ස්ථාන මාරු වලට යටත් වේ. ඉතා ප්‍රියමනාප සේවා ස්ථාන පහතින් දක්වා ඇත.

- දකුණු පළාත් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව
- දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

07. 2026 ජනවාරි 20 දින සිට 2026 ජූලි 20 දින අතර කාලයේ දී අන්‍යෝන්‍ය ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම්පත්‍ර භාර නොගත යුතු ය.

08. සෑම නිලධරයෙක් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වගබලා ගත යුතු ය. සාවද්‍ය හා අසම්පූර්ණ තොරතුරු ඇති බව හෙළිවුවහොත් ඒ පිළිබඳව අදාළ ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා එම ලැයිස්තු සකස්කළ හා හරි වැරදි බලන ලද නිලධරයන් වගකීමට බැඳී සිටින අතර ඔවුන් විනයානුකූල කටයුතු වලට ද යටත් වේ.

9. මාරු මණ්ඩල මගින් අමාත්‍යාංශයෙන්/ දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබාදී ඇති නිලධරයන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකිවන සේ ඔවුන් මුදා හැරීමට කටයුතු කළ යුතු ය.

10. දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුතු කළමනාකරණ සේවා නිළධාරී අධි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා 2026 වසරට අදාල වාර්ෂික ස්ථාන මාරුවීම් බලාත්මක කාලසටහන පහත දැක්වේ.

| | |
|---|---|
| 2026 ජනවාරි 20 දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු අයඳුම්පත් කැඳවීම |
| 2026 පෙබරවාරි 20 දිනට පෙර | ඉල්ලුම්පත් සහ වසර 05 ට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධරයන්ගේ වාර්තා ලබා ගැනීම අවසන් කිරීම |
| 2026 මාර්තු 09 දිනට පෙර | ස්ථාන මාරු මණ්ඩල රැස් වීම |
| 2026 මාර්තු 23 දිනට පෙර | මාරු මණ්ඩල තීරණ දැනුම් දීම |
| 2026 අප්‍රේල් 08 දිනට පෙර | ස්ථාන මාරු පිළිබඳව අභියාචනා ලබාදීම |
| 2026 අප්‍රේල් 27 දිනට පෙර | අභියාචනා මණ්ඩල රැස්වීම |
| 2026 මැයි 08 දිනට පෙර | අභියාචනා තීරණ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීම |
| 2026 මැයි 20 දිනට පෙර | අභියාචනා මණ්ඩල තීරණ දැනුම් දීම හා වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම |
| 2026 ජූලි 20 | ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම |

11. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ඔබගේ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියේ නිලධරයන් වෙත දැන ගැනීමට සලස්වන්න.

12. මෙම පටිපාටිය අනුව ස්ථාන මාරු ලැබීමට සුදුසුකම් ලබන ඔබ ආයතනයේ සිටින නිලධාරීන් විසින් මේ සමග අමුණා ඇති ආකෘති පත්‍ර 01 අනුව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් 2026 පෙබරවාරි 20 දිනට පෙර ලැබෙන සේ ලේකම්, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, 06 වන මහල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය, කළුවැල්ල, ගාල්ල යන ලිපිනය වෙත එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

සී.පී. රාජකරුණා
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
දකුණු පළාත

සී.පී. රාජකරුණා
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
දකුණු පළාත

# දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුතු කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය

1. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති 2310/29 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 251 I රීතියේ විධිවිධාන අනුව සහ 2019.06.01 දිනැතිව නිකුත් කර ඇති දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 මගින් පවරන ලද බලතල ප්‍රකාරව දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුතු කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පරිපාටියේ විධිවිධානයන් පහත අයුරින් නියෝග කරමි.

2. දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුතු කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් පහත දැක්වෙන ආකාරයෙන් සිදු කෙරේ.

**(අ) මාරු මණ්ඩල මගින් ( වාර්ෂික ස්ථාන මාරු)**

ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන නිලධරයන්ගේ ඉල්ලීම් ඉටු කිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරුවීම් මණ්ඩල ක්‍රියාත්මක කෙරේ. ඒ හැරුණු විට කිසියම් නිලධරයකුගේ සාධාරණ ඉල්ලීමක් ඉටු කිරීමට ඉඩ ලබා ගැනීම සඳහා හෝ අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් පරිපාලනමය කරුණු අනුව කරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස සේවා ස්ථානයක / ප්‍රදේශයක නියමිත සේවා කාලය සම්පූර්ණ කළ නිලධරයකු වෙනත් සේවා ස්ථානයකට මාරු කිරීමට ද මාරු මණ්ඩල තීරණ ගත හැක. මෙම මාරුවීම් 2026 වර්ෂයේ ජූලි 20 වන දිනයේ සිට ක්‍රියාත්මක වේ.

**(ආ) දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ( වාර්ෂික නොවන ස්ථාන මාරු)**

වාර්ෂික මාරු මණ්ඩලවල දී හැර දෛනිකව සිදු කෙරෙන කාර්යයක් වශයෙන් ස්ථාන මාරුවීම් සිදු නොකෙරේ. එහෙත් පරිපාලනමය අවශ්‍යතා, සේවා අවශ්‍යතා සහ විනය හේතු මත දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ස්ථාන මාරු නියෝග නිකුත් කෙරේ. සාමාන්‍ය රාජකාරී කටයුතුවලට බාධාවක් නොවන සුහද ස්ථාන මාරු ඉල්ලීම්ද, අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ හා දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ නිරීක්ෂණ හා නිර්දේශ ඇතිව ඉදිරිපත් කරන විට ඒ පිළිබඳව සලකා බලා අවශ්‍ය පියවර ගනු ලැබේ.

2:1 විශේෂ රාජකාරී අවශ්‍යතා හා හදිසි සේවා අවශ්‍යතා මත ස්ථාන මාරු කිරීම

පරිපාලනමය හා සේවා අවශ්‍යතා මත නිලධරයකුගේ ඉල්ලීමක් නොමැතිව හා කැමැත්ත විමසීමකින් තොරව ස්ථාන මාරු කිරීමට හෝ තාවකාලිකව අනුයුක්ත කිරීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හැකියාව ඇත.

3. දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුතු කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධිශ්‍රේණියේ නිලධාරීන්ගේ ස්ථාන මාරු කමිටු සංයුතිය

- දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන මාණ්ඩලික නිලධරයන් තිදෙනෙකු
- මෙම සේවාවට අයත් මුළු නිලධර සංඛ්‍යාවෙන් අවම වශයෙන් 15% ක් හෝ ඊට වැඩි සාමාජිකයන් පිරිසක් සිටින සෑම වෘත්තීය සමිතියක් විසින්ම දිස්ත්‍රික් පදනමින් නම් කළ නියෝජිතයෙකු බැගින්

හෝ

- පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා නිලධාරියෙකු මුදා හැර ඇති සෑම වෘත්තීය සමිතියකම දිස්ත්‍රික් පදනමින් නම් කළ නියෝජිතයෙකු බැගින්

## 4. වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුව

4:1 මාරු කමිටු තීරණ සම්බන්ධයෙන් හා මාරු මණ්ඩලවලදී තම ඉල්ලීම් ඉටු නොවීම සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි පරීක්ෂා කිරීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ සභාපතිත්වයෙන් යුත් අභියාචනා මණ්ඩලයක් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබයි.

4:2 වාර්ෂික ස්ථාන මාරු අභියාචනා කමිටුවේ සංයුතිය

- සභාපති : ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත.
- දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නම් කරන ලබන පහත තනතුරු දරණ සාමාජිකයන් දෙදෙනෙකු :

I. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) / නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
II. දකුණු පළාත් අමාත්‍යාංශයක ලේකම්වරයකු

සටහන :- මෙම නිලධරයන්ගෙන් එක් අයකු ස්ථාන මාරු කමිටුවේ සේවය කළ නිලධරයකු විය යුතුය. වාර්ෂික ස්ථාන මාරු කමිටුවට සහභාගී වූ වෘත්තීය සමිති නියෝජිතයන් හට වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටු සඳහා නිරීක්ෂණ මට්ටමින් සහභාගීවීමට අවස්ථාව ලබා දිය හැක.

4:3 වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුව විසින් පහත සඳහන් කරුණු පිළිබඳ පරීක්ෂා කර තීරණ ගනු ඇත.

- මාරුවීම් ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි කරන ලද මාරුවීම්
- නිලධරයාගේ ඉල්ලීම් ඉටු නොවූ අවස්ථා
- ස්ථාන මාරුව සම්බන්ධව අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත කරන ඉල්ලීම්, නිර්දේශ හා පැමිණිලි.
- ස්ථාන මාරු අයදුම් කරන ලද දිනයෙන් පසුව නිලධරයන්ට සිදුවූ හදිසි විපත් / හදිසි අනතුරු/ආපදා / අසනීප වැනි සානුකම්පිත තත්වයන් පිළිබඳව පිළිගත හැකි නිර්දේශ ඉදිරිපත් කර ඇත්නම් ඒවා පිළිබඳව

## 5. ස්ථාන මාරුවීම්වලදී සලකා බැලිය යුතු පොදු ප්‍රතිපත්ති

5:1 වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී කාලය ගණනය කරනු ලබනුයේ අදාළ වර්ෂයේ ජුනි 30 වන දිනටය. (2026 වාර්ෂික ස්ථාන මාරු සඳහා 2026.06.30)

5:2 සේවා කාලයන් ගණනය කිරීමේදී සේවයේ ආරම්භක දිනය සැලකිය යුත්තේ සේවයට වාර්තා කළ දිනයයි. නමුත් නිලධරයාගේ පාලන විෂය ඉක්මවා ගිය කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කළ දිනය පසු දිනයක් වේ නම් මාරු කමිටුව ඒ පිළිබඳව සැලකිල්ල යොමු කරයි.

5:3 සේවා කාලය ගණනය කිරීමේදී එක් අමාත්‍යාංශයක් / දෙපාර්තමේන්තුවක් හෝ දිස්ත්‍රික්කයක් තුළ අඛණ්ඩව හෝ ඛණ්ඩව කළ සේවා කාලවල එකතුව මුළු සේවා කාලයක් ලෙස ගණන් ගනු ලැබේ.

5:4 කිසියම් අමාත්‍යාංශයක් / දෙපාර්තමේන්තුවක් යටතේ කුමන දිස්ත්‍රික්කයක සේවය කළ ද එම සේවා කාලය එම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ සේවා කාලය වශයෙන් ගණන් ගනු ලැබේ. දිස්ත්‍රික්කයක් තුළ සේවා කාලය ගණන් ගැනීමේදී දිස්ත්‍රික්කය තුළ කුමන කාර්යාලයක සේවය කළ ද එම කාලවල මුළු එකතුව දිස්ත්‍රික්කය තුළ සේවා කාලය ලෙස ගණන් ගනු ලැබේ.

5:5 දෙපාර්තමේන්තුවක සේවය කළ කාලය ගණන් ගැනීමේදී, නිලධරයකුගේ පාලන විෂය ඉක්මවා ගිය හේතුවක් මත, සේවයේ නොසිටි කාලය ගණන් ගනු නොලැබේ.

5:6 වසර 03 ට වැඩි කාලයක් එකම සේවා ස්ථානයක සේවය කර ඇති නිලධරයන් ස්ථාන මාරුවීම් ඉල්ලුම් කළ හැකි අතර වසර 05 ට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් ස්ථාන මාරු ඉල්ලීම අනිවාර්ය වේ.

5:7 ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක අවුරුදු 03 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීහු අනිවාර්යයෙන් ස්ථාන මාරු ඉල්ලුම් කළ යුතු අතර ඔවුන් අනිවාර්යයෙන් ස්ථාන මාරුවීම්වලට යටත්වේ. එවැනි සේවා ස්ථානයක අවුරුදු 03 ක සේවා කාලයක් සම්පූර්ණ නොකරන ලද යම් නිලධාරියෙක් ස්ථාන මාරු ඉල්ලා සිටින්නේ නම් පරිපාලන හා සේවා අවශ්‍යතාවයන්ට යටත්ව එවැනි ස්ථාන මාරුවක් ලබා දිය හැකි ය.

5:8 වාර්ෂික ස්ථාන මාරු සඳහා කාලය ගණනය කරනු ලබන ජුනි 30 දිනට (2026 වාර්ෂික ස්ථාන මාරු සඳහා 2026 ජුනි 30 දිනට) වයස අවුරුදු 57 ඉක්මවූ නිලධරයන් දිස්ත්‍රික්කය තුළ වෙනත් සේවා ස්ථානයකට මාරු කළ හැකි වුවද ඔවුන්ගේ ඉල්ලීමක් නොමැතිව දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතු ය.

5:9 වාර්ෂික ස්ථාන මාරු සඳහා කාලය ගණනය කරනු ලබන ජුනි 30 දිනට (2026 වාර්ෂික ස්ථාන මාරු සඳහා 2026 ජුනි 30 දිනට) වයස අවුරුදු 58 ඉක්මවූ නිලධරයන් (59 වැනි වියෙහි පසුවන්නන්) ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි දිස්ත්‍රික්කය තුළ වුව ද මාරු නොකළ යුතු ය.

5:10 වෘත්තීය සංගමයක මව් සංගමයේ ලේකම්, සභාපති, භාණ්ඩාගාරික හා මධ්‍යම විධායක සභිකයන් මාරු කරන්නේ නම් අදාළ වෘත්තීය සමිතියේ ලේකම්ගේ නිර්දේශ සැලකිල්ලට ගෙන සංගමයේ කටයුතු වලට බාධා නොවන සේවා ස්ථානයකට මාරු කළ යුතු ය.

5:11 ආයතන සංග්‍රහයේ XXV වන පරිච්ඡේදයේ 7:1 වගන්තියේ දැක්වෙන අනුග්‍රහ භුක්ති විඳීමට අපේක්ෂා කරන වෘත්තීය සංගම්වල නිලධරයන් සංගමයේ ලේකම් මඟින් ඒ සඳහා ඉල්ලුම් පත්‍රයක් පිළියෙල කර (ආයතන සංග්‍රහයේ 7:5 උප වගන්තිය අනුව ) මාරු කමිටු රැස්වීමට සති දෙකකටවත් පෙර දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ. මේ පිළිබඳව පසුව කෙරෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

සැ.යු.: වෘත්තීය සංගමයක නිලධරයන් මාරු කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති 1 වන කාණ්ඩයේ 272 වගන්තියේ සිට 276 දක්වා රීතීන් අදාළ වේ.

5:12 යම් නිලධාරියෙකුගේ කලත්‍රයා පොලීසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේදී ආබාධිත තත්ත්වයට පත්ව ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන විට නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් කළ යුතු වන්නේ ඔවුන්ගේ ඉල්ලීම් අනුව පමණි. එසේම එවැනි නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් ඉල්ලීම් පිළිබඳව ප්‍රමුඛත්වය දැක්විය යුතු වේ.

5:13 සෑම විටම නිලධරයාගේ ඉල්ලීම අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට මාරුවීම් ලබාදීමට හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතු වේ.

5:14 ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක් තැන්ව සිටින කලත්‍රයන් වැනි පිළිගත හැකි කරුණු ඇතිව තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳව සැලකිල්ලට ගෙන මාරුවීම් කළ යුතු වේ.

5:15 ස්ථාන මාරුවීම් ඉල්ලීමේදී සහ අභියාචනා ඉදිරිපත් කිරීමේදී සළකා බලනු ලබන්නේ ඒ සඳහා සකස් කර හඳුන්වා දෙනු ලබන ආදර්ශ ආකෘති පත්‍රයට අනුවම සකස් කළ අයදුම්පත් පිළිබඳව පමණි.

5:16 මාරුවීම් අයදුම් කරන නිලධරයන් කිසියම් ප්‍රදේශයක නිශ්චිත කාර්යාලයකට පමණක් මාරුවී යාමට අපේක්ෂා කරන්නේ නම් ප්‍රදේශයේ නම හා කාර්යාලයේ නම යන දෙකම සඳහන් කිරීම වරදක් නැත. තමන් මාරුවී යාමට අපේක්ෂා කරන්නේ කිසියම් ප්‍රදේශයකට යාමේ අවශ්‍යතාවය මත ද නැතහොත් තමන් කැමති දෙපාර්තමේන්තු හෝ කාර්යාලයකට යාමට උවමනාවෙන්ද යන්න අයදුම්පතෙහි ඇඟවීමක් කිරීම සුදුසු ය. ඒ අනුව තමන්ගේ කැමැත්ත අනුපිළිවෙලින් දැක්වෙන පරිදි ප්‍රදේශ හෝ කාර්යාල නම් කළ යුතු වේ.

5:17 නිලධරයාගේ ඉල්ලීමක් අනුව කරන ලද මාරුවීමක් අවලංගු කරන ලෙස හෝ කල් දමන ලෙසට පසුව අභියාචනා කිරීමට එම නිලධරයාට හෝ ඒ පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට හෝ හිමිකමක් නැත.

6. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් පිළි නොපදින හෝ ක්‍රියාත්මක නොකරන නිලධරයන් පිළිබඳව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත වාර්තා වුවහොත්, ඒ පිළිබඳව තවදුරටත් දැනුම් දීමකින් තොරව අදාළ විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.

7. දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුතු දකුණු පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධිපන්තියේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී අනුගමනය කළ යුතු කාලසටහන, ඒ ඒ වර්ෂයේ දී දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**8. වාර්ෂික ස්ථාන මාරු නියෝග වලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම පිළිබඳ විස්තර**

8:1 ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියෝගයකට එරෙහිව කිසියම් රජයේ නිලධරයෙකු විසින් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනය ආකෘති පත්‍ර අංක 03 ප්‍රකාරව පමණක් ඉදිරිපත් කළ යුතු වන්නේ ය. තවද තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාළ ලියවිලි වල සහතික කළ පිටපත් එම අභියාචනය සමඟ ඉදිරිපත් කිරීමට ද, ඔහු ක්‍රියා කළ යුතු වන්නේ ය.

8:2 රජයේ නිලධරයෙකු විසින් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ, අදාළ අමාත්‍යාංශයේ ලේකම් හා දකුණු පළාත් ප්‍රධාන ලේකම් මඟින් වන අතර, එම අභියාචනයේ පිටපතක් අදාළ අමාත්‍යාංශයේ ලේකම් වෙත හා දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත ද යොමු කළ යුතු වන්නේ ය. තමා වෙත ඉදිරිපත් වන අභියාචනය අප්‍රමාදව තම නිරීක්ෂණ සහිතව ද දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම අදාළ අමාත්‍යාංශයේ ලේකම්ගේ වගකීම වන්නේ ය. නිලධරයාට තම කැමැත්ත පරිදි, අභියාචනයේ ප්‍රගමණ පිටපතක් සෘජුවම දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැක්කේ ය.

8:3 ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියෝගය නිකුත් කළ දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේ ය. නියමිත කාලය තුළදී ඉදිරිපත් නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

8:4 කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාර දෙනු ලබන අභියාචනය අදාළ සියලු ලිපිගොනු, ලිපිලේඛන හා වාර්තා ආදිය ඊට අදාළ තම නිරීක්ෂණ ද නිර්දේශ ද සහිතව වාර්ෂික ස්ථාන මාරු කාල සටහන අනුව නියමිත දිනට ප්‍රථම දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා හා දකුණු පළාත් ප්‍රධාන ලේකම් වගබලා ගත යුතු වන්නේ ය.

8:5 මෙම පරිච්ඡේදයේ සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචනා ඉදිරිපත් කිරීම සෑම රජයේ නිලධරයෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා බලනු නොබලන්නේ ය.

8:6 ඉහත 8:4 වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 14 ක් ඇතුළත, ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත්කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණ ගනු ඇත්තේ ය.

9. වාර්ෂික ස්ථාන මාරු කමිටු සඳහා සහභාගී වන සියලුම නිලධාරීන් හා වෘත්තීය සමිති නියෝජිතයන් විසින් රහස්‍යභාවය සුරකින බවට ලිඛිත ප්‍රකාශයක් (ආකෘති පත්‍ර 04 අනුව) ලබා දිය යුතු අතර, රහස්‍යභාවය සුරැකීමට කටයුතු නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගත හැකි ය.

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

සී.පී. රාජකරුණා
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
දකුණු පළාත

**සී.පී. රාජකරුණා**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
දකුණු පළාත

අංක 01 ආකෘතිය

## දකුණු පළාත් සභාව

## වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍රය -2026

(වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය අවු:05 හෝ ඊට වැඩි සියලුම නිලධාරීන් මෙම අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.)

| සේවය: | පන්තිය හා ශ්‍රේණිය: | දිස්ත්‍රික්කය: | අයදුම්පත් අංකය: |
|---|---|---|---|
| | | | |

| අ.) පෞද්ගලික තොරතුරු | | | |
|---|---|---|---|
| 01. සම්පූර්ණ නම | | | |
| 02. මුලකුරු සමඟ නම | | | |
| 03. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) | | | |
| 04.උපන්දිනය | | 05.ජා.හැ.ප.අංකය | |
| 06.2026.06.30. දිනය වයස | | 07.ස්ත්‍රී පුරුෂ භාවය | |
| 08.1. ස්ථිර ලිපිය | | 08.2. තාවකාලික ලිපිනය | |
| 09.1. දුරකථන අංකය (කාර්යාලය) | | 09.2. දුරකථන අංකය (පෞද්ගලික) | |
| 10. විවාහක අවිවාහක බව | | 11. කලත්‍රයාගේ නම | |
| 12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය | | | |
| 13. දරුවන් ගණන | 13.1. ඔවුන්ගේ වයස (2026.06.30 දිනට) | 13.2. ඉගෙනුම් ලබන පාසල් | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

**ආ.) සේවා තොරතුරු**

<table>
<tr><td colspan="4">ආ.) සේවා තොරතුරු</td></tr>
<tr><td>14.1 මුල් පත්වීම් ලිපිය</td><td></td><td>14.2 වර්තමාන තනතුරට පත් වූ/ අන්තර්ග්‍රහණය වූ දිනය</td><td></td></tr>
<tr><td colspan="2">14.3 වර්තමාන ශ්‍රේණියට උසස්වීම් ලැබූ දිනය</td><td colspan="2"></td></tr>
<tr><td>15.1 වර්තමාන නිත්‍ය සේවා ස්ථානය</td><td></td><td>15.2 නිත්‍ය සේවා ස්ථානය හා ලිපිනය</td><td></td></tr>
<tr><td>15.3 පිහිටි නගරය / උප නගරය</td><td></td><td>15.4 අනුයුක්ත කර ඇත්නම් එම සේවා ස්ථානය</td><td></td></tr>
<tr><td>15.5 වර්තමාන නිත්‍ය සේවා ස්ථානය අයත් අමාත්‍යාංශය /ආයතනය</td><td></td><td>15.6 දෙපාර්තමේන්තුව</td><td></td></tr>
<tr><td>16.දැනට රාජකාරී ඉටු කරනු ලබන අංශය</td><td colspan="3"></td></tr>
<tr><td>17. ඉටු කරනු ලබන විෂය රාජකාරීන්</td><td colspan="3"></td></tr>
<tr><td>18. ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම</td><td colspan="3"></td></tr>
<tr><td rowspan="6">19. සේවා කාලය තුළදී ලබා ඇති පුහුණුවීම්</td><td>පුහුණුව</td><td>ආයතනය</td><td>කාලසීමාව</td></tr>
<tr><td></td><td></td><td></td></tr>
<tr><td></td><td></td><td></td></tr>
<tr><td></td><td></td><td></td></tr>
<tr><td></td><td></td><td></td></tr>
<tr><td></td><td></td><td></td></tr>
<tr><td>20. වර්තමාන සේවා ස්ථානයට වාර්තා කළ දිනය</td><td></td><td>21. 2026.06.30 දිනට වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය</td><td></td></tr>
</table>

22. රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන (වර්තමාන සේවා ස්ථානයේ සිට අනුපිළිවෙලින් සඳහන් කරන්න.)

| සේවා ස්ථානය | සේවා කාලය | | |
|---|---|---|---|
| | සිට | දක්වා | කාලය |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

**ඇ.) ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු (තම කැමැත්තේ අනුපිළිවෙළට සේවා ස්ථාන 05ක් සඳහන් කිරීම අනිවාර්ය වේ.)**

| 23. | සේවා ස්ථානය | ආසන්නතම නගරය/ උප නගරය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

24. ස්ථාන මාරු ඉල්ලුම් නොකිරීමට විශේෂ හේතු තිබේ නම් ඒවා සඳහන් කරන්න: (නිලධාරියා හෝ යැපෙන්නන් යම් ආබාධිත තත්වයකින් පෙළෙන්නේ නම් ඒ බවට වෛද්‍ය සහතිකවලින් තහවුරු කිරීමට යටත්ව මෙහි සඳහන් කරන්න./ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක වන කාලය තුළ ප්‍රසූත නිවාඩු යාමට නියමිතව ඇත්නම් ඒ බව සඳහන් කරන්න.)

25. ඔබ 2025 වාර්ෂික ස්ථාන මාරුවීම් වලට යටත්ව ස්ථාන මාරුවීම ක්‍රියාත්මක නොවූයේ නම් එසේ වීමට හේතුව:

26. ඔබ ස්ථාන මාරු අපේක්ෂා නොකරන්නේ නම් ඊට හේතු:

27. ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවටත්, අසත්‍ය තොරතුරු වාර්තා කිරීමෙන් මට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට හැකි බව දන්නා බවටත් සහතික වෙමි.

.................................... ..............................................

දිනය අත්සන

**ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

..........................................................................(අදාළ නිලධාරියාගේ මුලකුරු සහිත නම) විසින් සම්පූර්ණ කර ඇති තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදි බවට සහතික කරමි.

ඒ අනුව එම නිලධාරියාගේ/ නිලධාරිනියගේ ස්ථාන මාරු ඉල්ලීම නිර්දේශ කරමි/නොකරමි.

............................. ....................................

දිනය අත්සන හා නිලමුද්‍රාව

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**

..........................................................................(මෙනවිය/මයා/මහත්මිය) විසින් ඉදිරිපත් කර ඇති ස්ථාන මාරු අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

............................. ....................................

දිනය අත්සන හා නිලමුද්‍රාව

**අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය**

..........................................................................(මෙනවිය/මයා/මහත්මිය) විසින් ඉදිරිපත් කර ඇති ස්ථාන මාරු අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

.............................

....................................

දිනය අත්සන හා නිලමුද්‍රාව

**ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය**

..........................................................................(මෙනවිය/මයා/මහත්මිය) විසින් ඉදිරිපත් කර ඇති ස්ථාන මාරු අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

............................. ....................................

දිනය අත්සන හා නිලමුද්‍රාව

ආකෘති පත්‍ර අංක 02

**<u>එක් සේවා ස්ථානයක අවුරුදු 05කට වැඩි කාලයක් සේවය කර ඇති සියලුම දකුණු පළාත් කළමනාකරණ සේවා නිලධාරී අධි ශ්‍රේණි නිලධාරීන්ගේ විස්තර මෙහි අනිවාර්යයෙන්ම ඇතුළත් විය යුතු බව සලකන්න. (2026.06.30 දිනට)</u>**

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව :- ..........................................................................................

පළාත් පාලන ආයතන :- ..........................................................................................

ප්‍රාදේශීය කාර්යාලය :- ..........................................................................................

| අනු අංකය | නිලධාරියාගේ නම (මයා/මිය/මෙය යන්න සඳහන් කරන්න) | පත්වීම් දිනය | ජාතික හැඳුනුම්පත් අංකය | තනතුර/ශ්‍රේණිය හා මාධ්‍යය | උපන්දිනය හා 2026.06.30 දිනට වයස | වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය 2026.06.30 දිනට | විවාහක/අවිවාහක බව කලත්‍රයාගේ සේවා ස්ථානය | දරුවන් ගණන/වයස/ඉගෙනුම ලබන පාසල | දැනට පදිංචි ප්‍රදේශය හා ලිපිනය | මුල් පත්වීමේ සිට සේවා ස්ථාන හා කාලසීමාවන් | වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්කර නොමැතිනම් ස්ථාන මාරුවක් ලැබුණ හොත් සේවය කිරීමට කැමති ස්ථාන 03ක් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

සකස් කළේ :- ........................ අත්සන:-................................ තනතුර:...........................................

පරීක්ෂා කළේ :- ...................... අත්සන:-................................ තනතුර: ..............................................

දිනය :- .................................

..............................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

ආකෘති පත්‍ර අංක 03

**දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුතු කළමනාකරණ සේවා අධි ශ්‍රේණියේ නිලධාරීන්ගේ ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් අභියාචනා ඉදිරිපත් කිරීමේ අයදුම්පත්‍රය**

01. සම්පූර්ණ නම :- ..........................................................................................................

02. ස්ථාන මාරු ලේඛනයේ සඳහන් නම :- ...................................................................................

2.1 හැඳුනුම්පත් අංකය :- ...........................................................................................

03. ස්ථිර පදිංචි ලිපිනය :-

.......................................................................................................................................

.......................................................................................................................................

04. තාවකාලික ලිපිනය :-

.......................................................................................................................................

05. දුරකථන අංකය :- ...............................................................................................

06. වර්තමාන සේවා ස්ථානය :-

.......................................................................................................................................

07. අයත් අමාත්‍යාංශය :- ...............................................................................................

08. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය (2026.06.30 දිනට) අවු : ..........................මාස : ...................
දින : .....................

09. වර්තමාන තනතුරේ මුළු සේවා කාලය අවු : .................. මාස : .................... දින : ....................

10. 10.1 වාර්ෂික ස්ථාන මාරු යටතේ ස්ථාන මාරු කරන ලද සේවා ස්ථානය :-

.......................................................................................................................................

10.2 ස්ථාන මාරු ලේඛනයේ අනු අංකය :- ...................................ස්ථාන මාරු අංකය : ....................

10.3ඔබ සමඟ ස්ථාන මාරු කරනු ලබන අනුප්‍රාප්තිකයා/අනුප්‍රාප්තිකයන්ගේ නම් :-

.......................................................................................................................................

11. අභියාචනා මඟින් ඉල්ලුම් කරනු ලබන වෙනත් සේවා ස්ථාන :-

.......................................................................................................................................

.......................................................................................................................................

12. අභියාචනා ඉදිරිපත් කිරීමට හේතු :- (අභියාචනාව මඟින් ඉදිරිපත් කරන කරුණු සනාථ කිරීමට අදාළ ලේඛන ද මේ සමඟ අමුණා ඉදිරිපත් කළ යුතු ය.)

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

13. වෙනත් කරුණු :-

.......................................................................................................................................

.......................................................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය නිවැරදි බව ප්‍රකාශ කරමි.

| | |
|---|---|
| ........................................ | ................................ |
| දිනය | අත්සන |

14. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :- ...............................................................................

.......................................................................................................................................

| | |
|---|---|
| ........................................ | ........................................ |
| දිනය | ආයතන ප්‍රධානියාගේ අත්සන<br>සහ නිල මුද්‍රාව |

මගේ අංකය ...............................

ලිපිනය .......................................

දිනය ........................................

........................................................මයා/මිය/මෙය

........................................................(තනතුර)

........................................................( ආයතනය )

**<u>..............................................................වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව සේවයෙන් නිදහස් කිරීම.</u>**

දකුණු පළාත් ( <u>අදාළ වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා දුන් නිලධාරියාගේ</u> ) අංක ...............................හා ............................. දිනැති වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව , (<u>වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක වන දිනය</u>) දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔබ (<u>වාර්ෂික ස්ථාන මාරු ලබාදී ඇති සේවා ස්ථානය</u> ) වෙත ස්ථාන මාරු කර ඇත.

02. ඒ අනුව ............................................... දින නව සේවා ස්ථානයේ රාජකාරී භාර ගැනීමට හැකි වන පරිදි .................................................................. දින සේවයෙන් පසුව ඔබ මෙම කාර්යාලයේ / අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ සේවයෙන් නිදහස් කරන බව කාරුණිකව දන්වා සිටිමි.

03. ස්ථාන මාරුවී යාමට පෙර ඔබ භාරයේ ඇති රජයට අයත් සියලු ලිපි ගොනු හා ලිපිලේඛන , යතුරු , පරිගණක මුර පද , කාර්යාලයීය හැඳුනුම්පත සහ රජය සතු අනෙකුත් දේපළ ( <u>නම් කළ නිලධාරියාගේ නම සහ තනතුර</u> ) වෙත ලිඛිතව භාර දීමට කටයුතු කළ යුතුය.

04. නව සේවා ස්ථානයේ රාජකාරී භාරගෙන නිසි නිළ මඟින් ඒ බව මා වෙත වාර්තා කිරීමට කටයුතු කරන්න.

05. උක්ත වාර්ෂික ස්ථාන මාරු නියෝග ප්‍රකාරව නියමිත දින නව සේවා ස්ථානය වෙත රාජකාරී සඳහා වාර්තා නොකළහොත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XV වැනි පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව ඔබ සිය කැමැත්තෙන් තනතුර අත්හැර ගියා සේ සලකා කටයුතු කරන බව ද ඔබ වෙත දැනුම් දෙමි.

අත්සන .......................................................

නම..............................................................

තනතුර .......................................................

නිලධාරියාගේ ස්ථිර පදිංචි ලිපිනය ..............................................................................................

දුරකතන අංකය ...................................

පිටපත්

01.
02.
03.